**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2019**

**------------------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීනව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට වූ විශ්‍රාම වැටුප් වගකීම එවැනි ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව රු.70,252,869,112ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.<br>මේ වන විට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීමෙන් සාධාරණ දායකත්වයක් විශ්‍රාම වැටුප් දායකයාගෙන් ලබාගැනීමට අදාළ සාකච්ඡා පැවැත්වෙමින් ඇත. ඒ අනුව ඉදිරියේදී මේ පිළිබඳව විධිමත් ආකාරයකින් නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට හැකිවේයැයි අදහස් කෙරේ. | විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයුගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුය. |

### 1.5.2 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂය අවසානයට රු.74,347,975,129 ඍණ ශේෂයක් ගෙන තිබූ අතර ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් රු.5,098,968,963ක් වී තිබුණි. තවද 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ නියෝග පරිදි 2014 ජනවාරි 01 දින සිට විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කළද දායක මුදල් අයකර ගැනීම 1987 මැයි 07 දිනැති අංක 452/12 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබූ ක්‍රමය පරිදි සිදුකර තිබුණි. ඒ අනුව 2018 හා 2019 වර්ෂ වලදී ගොවි දායකත්වය පිළිවෙලින් රු.24,552,961ක් හා රු.21,495,773ක් වූ අතර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු.3,059,370,767 ක් හා රු.3,217,332,522 ක් වී තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහළ යාම නිසා 2018 හා 2019 වර්ෂ වලදී පිළිවෙලින් රු.2,725,000,000 ක් හා රු.3,065,000,000ක් භාණ්ඩාගාරය මඟින් ලැබී තිබූ අතර භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී. | අංක 153/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට කටයුතු කර ඇති අතර ස්වයං මුල්‍යා පදනමකින් පවත්වාගෙන යා හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් එමගින් හඳුන්වාදෙන ලදී. ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වුවද විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ගොඩ නැගී ඇති විශ්‍රාම වැටුප් වගකීමට සාපේක්ෂව අරමුදල ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත දැනටමත් අවශ්‍ය වාර්තාවන් ඉදිරිපත් කර ඇති අතර, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමෙන් පසු අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව ස්වයං මුල්‍යා පදනමකින් පවත්වාගෙන යා හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නිති රීති, රෙගුලාසි ආදීයට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත. | | | |
| (අ) 4 වගන්තිය | නියමිත සුදුසුකම් දරන්නාවූ ද වයස අවු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 59 නොවැඩි ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවීන් හට තම වෘත්තීය කටයුතු කරගෙන යාමට නොහැකි ස්ථිර අර්ධ දුබලතාවයක් හෝ පූර්ණ දුබලතාවයක් වූ විට ආර්ථික වශයෙන් යම් පිටුවහලක් වීමට දීමනාවක් ගෙවීම, මරණයකදී මරණ පාරිතෝෂිකයක් ගෙවීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් ගෙවීම අරමුණ වුවද 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා යෝජනා ක්‍රමයට කිසිදු සාමාජිකයෙකු බඳවා ගෙන නොතිබුණි | 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගොවි විශ්‍රාම වැටුප් අති විශේෂ ගැසට් නිවේදනය පරිදි විශ්‍රාම වැටුප් ගෙව්වද මෙම යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු වාරිකය ඉහළ අගයක් ගත් බැවින් මේ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවන්හිදී ලබාදුන් උපදෙස් පරිදි මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරන ලද අතර ඒ අනුව මෙම යෝජනා ක්‍රමයට බඳවා ගැනීම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට සිදු විය. 2015 වර්ෂයේදී සිදුවූ රාජ්‍ය ප්‍රතිපත්ති වෙනසත් සමග නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කර එය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කොට, ඒ සඳහා උපදෙස් ගැනීමට විශේෂඥ කමිටුවකට යොමු කරන ලදි. 2019 නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයන් බඳවා ගැනීමට අවශ්‍ය කටුයුතු සිදුකිරීමට අපේක්ෂිතය. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුණ පරිදි සාමාජිකයන් අඛණ්ඩව බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)15(2),(3) වගන්ති | යම් දායකයෙකු වෙත නිකුත් කර ඇති සහතික යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් මඟින් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය. එසේ නොදැන්වීම හේතුවෙන් වාරික නොගෙවීම මත අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අවස්ථාව මගහැරී තිබීමෙන් සමාලෝචිත වර්ෂය තුළදී වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම ඇති බව අදහස් කරමින් විශ්‍රාම වැටුප් අයදුම්පත් ඉදිරිපත් කළ පුද්ගලයින් 1,863 කටගොවි විශ්‍රාම වැටුප් ලබා දී නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති ගොවීන් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පැහැර හැරියහොත් ඔවුන්ගේ දායකත්වය අවලංගු වන අතර ඒ පිළිබඳව ඔවුන් යෝජනා ක්‍රමයට දායක වන අවස්ථාවේදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කරන අතර, ඔවුන් වෙත ලබාදෙන වාරික මුදල් සටහන් පොතේ සහ සහතික ඔප්පුවෙහි ඒ පිළිබඳව පැහැදිලිව සටහන් කර ඇත. එසේ දායකත්වය අවලංගු වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී පොලියද සමගින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් එම දායකයා වෙත නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 20 වගන්තිය | උපදේශන කමිටුව සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු වශයෙන් සාමාජිකයන් 12 දෙනෙකු පත් කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 06 දින දක්වා සියලුම සාමාජිකයන් පත්කිරීම අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී උපදේශන | ගොවි විශ්‍රාම වැටුප් උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට හා කඩිනමින් උපදේශක කාරක සභාව රැස්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය. | උපදේශන කමිටුව රැස් වී යෝජනා ක්‍රමයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සභාව රැස්වී නොතිබුණු අතර අවසන් වරට උපදේශක සභාව රැස්වී තිබුනේ 2016 නොවැම්බර් 03 වන දිනය. මේ අනුව අවුරුදු 03ක් තුළ උපදේශන සභාව පවත්වා නොතිබුණි. | |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බැංකු ගිණුම් 03 කට අදාළව 1992 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.1,179,624ක් වටිනා චෙක්පත් 117 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ශේෂයන් වසර 15-25ක් අතර පැරණි ශේෂයන් වන අතර 2003 වර්ෂයේදී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කළ හැකි සියලුම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කළ අතර එසේ සොයා ගත නොහැකි වූ ශේෂයන් මෙලෙස ඉදිරියට ගෙනවිත් ඇත. මෙම තත්වයට බොහෝ විට හේතු වී ඇත්තේ එකම චෙක්පතට දෙවරක් රිසිට්පත් නිකුත් කිරීම වේ. මේ පිළිබඳව දිගින් දිගටම විගණන කමිටු වලදී හා මහා භාණ්ඩාගාරයේදී පැවති විශේෂ සාකච්ඡා වලදී කරුණු සොයා බැලීමෙන් පසුව, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එහි අනුමැතිය ලැබූ පසු ගිණුම් වලින් කපාහැරීමට බලාපොරොත්තු වේ. | එකම චෙක්පතට දෙවරක් රිසිට්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 වර්ෂය අවසන් වනවිට යෝජනා ක්‍රමයේ සක්‍රීය දායකයින් සංඛ්‍යාව 959,254ක් වූ අතර, 2012 වර්ෂයෙන් පසු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ, බෙලහීන වූ , මියගිය සංඛ්‍යාව හා වාරික නොගෙවීම මත ඉවත් වීම් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. ඒම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට සක්‍රීය සමාජික සංඛ්‍යාව, වාර්ෂිකව එකතු | යෝජනා ක්‍රමයේ සක්‍රිය දායකයන් හඳුනා ගැනීම සඳහා පසු වාරික පරිගණක ගත කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඉදිරියේදී අඛණ්ඩව පසු වාරික පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට සැලසුම් කර ඇති අතර, මේ වන විට අභ්‍යාසලාභීන් තිදෙනෙකු පසු වාරික පරිගණක ගත කිරීම සඳහා පූර්ණ කාලීනව යොදවා ඇත. ඉදිරියේදී මෙම දත්ත ඇතුලත් කිරීමේ ධාරිතාව තවත් වැඩිකිරීමට අපේක්ෂා කෙරේ. යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ, බෙලහීන වූ හා මියගිය දායකයන්ගේ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | තොරතුරු පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

වන දායකයා හා ගෙවිය යුතු නිවැරදි විශ්‍රාම වැටුප් වටිනාකම කොපමණද යන්න ගණනය කිරීමට යෝජනා ක්‍රමයට නොහැකිව පැවතුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 58,984,105 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.312,010,448 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 253,026,343 ක ඌනතාවය අඩුවීමක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාර ප්‍රදාන වැඩි වී තිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වූ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන කිරීම කළයුතු බව 2015 අගෝස්තු 25 වන දින පැවැත්වූ උපදේශක කාරක සභා වාර්තාවේ සඳහන්ව තිබුණි. ඒ අනුව රු.1,726,875ක් වැයකර දිස්ත්‍රික්ක 08 ක පමණක් සමීක්ෂණ කටයුතු සිදු කර තිබුණි. අනිකුත් දිස්ත්‍රික්ක වලද කඩිනමින් එම කාර්යය නිමකර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මණ්ඩලය කටයුතු නොකිරීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය බවට පත්වී තිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනේදී, තොරතුරු ඉදිරිපත් කර තිබූ ගොවීන්ගේ සංඛ්‍යාව අඩු අගයක් ගත්ත ද ලැබී ඇති තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. මණ්ඩලය අපේක්ෂා කළ පරිදි ගොවීන් සමීක්ෂණයට නිසි පරිදි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා අදාළ ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේදී මෙම තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ. | ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත පරිදි වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට සාමාජිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු බව සඳහන් වේ. එසේ වුවද ඊට පටහැනිව ආයතනය විසින් විශ්‍රාම වැටුප සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබීමෙන් 2017 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා ගොවීන් 27,049 කට එකතුව රු.584,359,397ක විශ්‍රාම වැටුප් මුදල් හිඟව පැවතිණි. එසේම මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2012 – 2013 කාල පරිච්ඡේදයට අදාළව ගොවීන් 90,573කට හිමි විශ්‍රාම වැටුප් රු.3,033,329,200 ක් ද ගෙවා නොතිබුණි. | 20,000 කට අධික ගොවීන් සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් ලැබීම සඳහා පොරොත්තු ලේඛනයේ සිටි බැවින් එම ගොවීන් කඩිනමින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙම නිසා පොරොත්තු ලේඛනයේ සිටි ගොවීන් 20,503 කට විශ්‍රාමවැටුප් ගෙවීමට හැකියාව ලැබී ඇත. ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙම හිඟ මුදල භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් අනුව ඉදිරියේදී ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලබන අතර, හිඟ විශ්‍රාම වැටුප් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ලෙස ගිණුම් ගත කර ඇති අතර, ගෙවනු ලබන අවස්ථාවේදී එකී වගකීමෙන් ඉවත් කරනු ලැබේ. | හිඟයක් ඇති නොවන පරිදි අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) දැනට පවතින ක්‍රමය වෙනුවට ගොවි ප්‍රජාව වෙනුවෙන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා විද්වත් කමිටුව 2019 ජූලි 01 දින රැස්වූ අතර එම කමිටුව වෙත ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මගින් ඉදිරිපත් කළ විකල්ප යෝජනා ක්‍රම 4 ට අදාළව ගණනය කිරීම් වාර්තා සකස් කිරීම, එම යෝජනා ක්‍රම 4 න් තෝරාගත් යෝජනා ක්‍රමය සකස් කිරිමට අදාළ තොරතුරු විද්වත් කමිටුව වෙත නැවත යොමු කිරීම, එම යෝජනා සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තා සකස් කිරීමෙන් අනතුරුව අගෝස්තු මාසය තුළදී භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම හා එයට අනුමැතිය ලබා ගැනීම හා | ගොවි හා ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පත් කරන ලද විද්වත් කමිටුව සියයට 9 ආයෝජන අනුපාතය යටතේ ගොවි හා ධීවර ප්‍රජාව වෙනුවෙන් විශ්‍රාම වැටුපක් සැකසීම සුදුසු බවට තීරණය කරන ලදි. තවද මෙම යෝජනා ක්‍රමයන් සඳහා ආදායම් ගණනය කිරීමේ ක්‍රමවේදයන් සොයා බැලීමටත් තීරණය විය. වගා බදු අරමුදල හා ගොවිසෙත ලොතරැයි ආදායම් මේ සඳහා යොදා ගත හැකි බව මූලික වශයෙන් නිරීක්ෂණය කරන ලදි.<br><br>නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිළිබඳ සඳහන් කර ඇති බැවින් එම රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත ය. | රාජය ප්‍රතිපත්ති අනුව කඩිනමින් නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකසා දායකයින් බඳවා ගැනිමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| සම්බන්ධීකරණය කිරීමට තීරණය ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය ක්‍රියාත්මක වී නොතිබුණි. | | |
| (ඇ) නොගෙවූ විශ්‍රාම වැටුප් ලාභීන්ගේ මුදල් හා මියගිය පුද්ගලයන්ගේ විස්තර යාවත්කාලීන කර ගැනීම සඳහා තැපැල්පති විසින් දිසා ගිණුම් කාර්යාල වලට අයත් තැපැල් හා උප තැපැල් ස්ථානාධිපතිවරුන් වෙත නිකුත් කර තිබූ 2015 ජූලි 07 දිනැති ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ලිපිය පරිදි, මණ්ඩලය මගින් ලබා දී ඇති විද්‍යුත් ලිපිනය භාවිතා කර නොගෙවන ලද විශ්‍රාම වැටුප්ලාභීන්ගේ විස්තර වාර්තාවක් මාසිකව දිසා ගිණුම් කාර්යාලයන්හි තැපැල් හා උප තැපැල් ස්ථානාධිපතිවරුන් විසින්කෘෂිරක්ෂණ මණ්ඩලයට එවිය යුතු වුවද මාතර හා කොළඹ දිසා ගිණුම් කාර්යාල එසේ නොකිරීම නිසා මාතර රු.1,000,000 - රු.1,700,000ක හා කොළඹ රු.100,000 - රු.300,000ක මුදල් ප්‍රමාණයන් වසර පුරා කෘෂිරක්ෂණ මණ්ඩලය හා දිසා ගිණුම් කාර්යාල අතර හුවමාරු වෙමින් පැවතිණි. | නොගෙවූ විශ්‍රාම වැටුප් ආපසු එවීම පිළිබඳ තැපැල්පති විසින් නිකුත් කරන ලද 2015 ජූලි 07 දිනැති උපදෙස් ලිපිය අනුව දිසාගණකාධිකාරී කාර්යාල කටයුතු කර නොමැති බවට විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද නිරීක්ෂණය පිළිබඳ තැපැල්පතිතුමා දැනුවත් කිරීම කටයුතු කරන ලදි. ඒ අනුව විශ්‍රාම වැටුප් ගෙවීම සෑම මසකම 07 වෙනි දින සිට 15 වන දින තුළ වැඩ කරන දින 06ක් ඇතුළත සිදු කළ යුතු බවත්, සියලු ගොවි විශ්‍රාම වැටුප් සාරාංශ, නොගෙවන ලද විශ්‍රාම වැටුප්ලාභීන්ගේ විස්තර හා ඉතිරි මුදල් ඊළඟ මාසයේ 10 වෙනි දිනට ප්‍රථමයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලැබීමට සැලැස්විය යුතු බවත්, ඒ පිළිබඳ දිසාගණකාධිකාරිවරු දැනුවත් කර රජයේ විගණනය මගින් පෙන්වා දී ඇති ප්‍රමාදයන් වලක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇත.<br><br>මේ වන විට මාතර හා කොළඹ දිසා ගණකාධිකාරීවරුන් දැනුවත් කර නොගෙවූ විශ්‍රාම වැටුප් මුදල් හා නාමලේඛන කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | නොගෙවන ලද විශ්‍රාම වැටුප් ලාභීන්ගේ විස්තර වාර්තාවක් ගෙන්වා ගැනීමට කටයුතු කළයුතු වේ. |